# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2322/42 - 2023 මාර්තු මස 08 වැනි බදාදා - 2023.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)**

38(3) උපවගන්තිය යටතේ වූ නියමය

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38(1)(ඇ) වගන්තිය යටතේ මා විසින් පළ කරන ලද අංක 2317/16 හා 2023.01.30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් කළ පරිදි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම 2023 මාර්තු මස 09 දින නොපැවැත්වෙන බවද,

මැතිවරණ කොමිෂන් සභාවේ පාලනයෙන් පරිබාහිර අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු හේතු කොටගෙන එකී ඡන්ද විමසීමේ දිනය කල් දැමීමට සිදු වී ඇති බැව් මැතිවරණ කොමිෂන් සභාව විමසීමෙන් අනතුරුව එකී කොමිෂන් සභාව විසින් මා හට උපදෙස් දී ඇති හෙයින් ද,

එකී පළාත් පාලන ආයතනවලට අදාළ නව ඡන්ද විමසීමේ දිනය වශයෙන් 2023 අප්‍රේල් මස 25 වන දිනය මවිසින් මෙයින් නියම කරන බවද,

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38(1)(ඇ) උප වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 38(3) උප වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**කලාමති පද්මරාජා,**
තේරීම්භාර නිලධාරි,
මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කය.

2023 මාර්තු මස 08 වැනි දින,
මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.


1A - G 39060 — 31 (2023/03)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

මඩකලපුව මහා නගර සභාව
එරාවූර් නගර සභාව
කාත්තන්කුඩි නගර සභාව
කෝරළෙයිපත්තු බටහිර ප්‍රාදේශීය සභාව
එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව
කෝරළෙයිපත්තු ප්‍රාදේශීය සභාව
කෝරළෙයිපත්තු උතුර ප්‍රාදේශීය සභාව
මන්මුනෙයි දකුණ සහ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාව
මන්මුනෙයි ප්‍රාදේශීය සභාව
මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාව
මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව
පෝරතීව්පත්තු ප්‍රාදේශීය සභාව

EOG 03- 0100

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.